**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

**අදියර III විභාගය - ජූලි 2020**

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

අධ්‍යාපන පාඨමාලා පෙළපොත මත පදනම් වූ අනිවාර්ය ප්‍රශ්ණ 9 ක් සහිත කොටස් තුනකින් මූල්‍ය පාලනයක් සහ විගණන ප්‍රශ්ණ පත්‍රය සමන්විත විය. **A කොටස** එකකට ලකුණු 5 බැගින් වූ ප්‍රශ්න 4 ක් ද, **B කොටස** එකකට ලකුණු 10 බැගින් වූ ප්‍රශ්ණ 3 ක් ද, **C කොටස** එකකට ලකුණු 25 බැගින් වූ ප්‍රශ්ණ දෙකක් ද ඇතුලත් විය. දී ඇති කාලය තුළ අයදුම්කරුවන් බොහොමයක් ප්‍රශ්න 9 ටම උත්තර සපයා තිබූ බව දක්නා ලදී. ප්‍රශ්න පත්‍ර සඳහා උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක විය.

## <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** සංයුත්ක පාලනයේ මූලධර්ම දෙකක් හඳුනා දක්වන ලෙසද **(b) කොටසින්** සංයුත්ක පාලනයන් සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව පිළිබඳව අඩංගු කර ඇති මගපෙන්වීම් තුනක් සඳහන් කරන ලෙසද අයදුම්කරුවන්ගෙන් අවශ්‍යකර තිබුණේය.

**(a) කොටස** සඳහා අයදුම්කරුවන්ගෙන් සැහෙන ප්‍රමාණයක් ඉතා හොද ලකුණු ලබාගෙන තිබුණේය. කෙසේ වෙතත් **(b) කොටස** සඳහා දී තිබූ උත්තර එතරම් සතුටුදායක නොවූවා මෙන්ම සම්පූර්ණ ලකුණු ලබා ගැනිම සඳහා සම්පූර්ණ හා නිශ්චිත නොවීය. අයදුම්කරුවන් සමහර දෙනෙක් සපයා තිබූ අදාල නොවූ උත්තර පහත පරිදි විය.

උදා:- විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතුය.
සභාපතිවරයෙකු සිටිය යුතුය.
ක්‍රියාකාරකම් විනිවිද භාවයෙන් යුක්ත විය යුතුය.
අධ්‍යක්ෂවරුන්ට මූල්‍ය දැනුම තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 02

දැනුම පවත්නා ආපදා හේතුවෙන් සංවිධානයකට මුහුණ පැමට යෙදී ඇති අවදානම් තුනක් සහ අභ්‍යන්තර අවදානම් දෙකක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කරන ලදී. අයදුම්කරුවන් බොහොමයකට මෙම සරල ප්‍රශ්නයට හොදින් උත්තර ලියා ලකුණු 5 ක් ලබා ගත හැකිවී තිබුණේය. එහෙත් ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය වෙනස් කෝණයකින් තේරුම් ගෙන ප්‍රශ්නයේ දෙන ලද සිද්ධියට යොමුවී නැත. සමහරු බාහිර අවදානම් අභ්‍යන්තර අවදානම් සමග පටලවාගෙන තිබුණි. හඳුනා ගන්නා ලද පොදු වැරැද්ද එය විය. තවද ලියා තිබූ සමහර උත්තර නිශ්චිත නොවීය. එනම් උදා:- දේශපාලනික අවදානම, ආර්ථික අවදානම, පාරිසරික අවදානම, කීර්තිනාම අවදානම සහ අනුකූල වීමේ අවදානම ආදිය ලියා තිබීමය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලද්දේ සහතික වීමේ කාර්යභාරයන් සම්බන්ධයෙන් පාර්ශව තුනේ සම්බන්ධතාවය පැහැදිලි කිරීම සම්බන්ධව දැනුමය. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට හොඳින් උත්තර සපයා තිබුණේය.

සමහර අයදුම්කරුවන් සහතික වීමේ කාර්යභාරයකට සම්බන්ධිත පාර්ශ්ව තුන පමණක් සඳහන් කර තිබුණේය. එහෙත් ඔවුන් අතර සම්බන්ධතාවය පැහැදිලි කර තිබුණේ නැත. එම නිසා ඔවුන්ට සම්පූර්ණ ලකුණු ලබා ගත නොහැකි විය. සමහරු එක් එක් පාර්ශවයේ වගකීම් පටලවාගෙන තිබුණි. උදා:- මූල්‍ය ප්‍රකාශන සඳහා වෘත්තිකයා වගකිව යුතු අතර වගකිව යුතු පාර්ශවය විගණන මතය සඳහා වගකිව යුතුය ආදිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

ආයතන මට්ටමින් සහ තනි තනි විගණන මට්ටමින් තත්ව පාලන ක්‍රියා පටිපාටි පවත්වාගෙන යාම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. ප්‍රශ්නයේ **(a) කොටසින්** තත්ව පාලන පද්ධතියක මූලිකාංග ගැන විමසා ඇති අතර කාර්යභාරය යොදවනු ලබන කණ්ඩායමේ සාමාජිකයන් විසින් ඉටුකරනු ලබන වැඩ පත්‍රිකාවකින් සමාලෝචනය කිරීම යටතේ තනි කාර්යභාරයක් මත ඇතුලත් කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ **(b) කොටසින්** විමසා බැලේ.

ප්‍රශ්නයේ **(a) කොටසට** අයදුම්කරුවන් සතුටුදායක අන්දමින් උත්තර සපයා තිබුණද **(a) කොටස** සඳහා තිබූ උත්තර සතුටුදායක මට්ටමක නොවීය. සමහර අයදුම්කරුවන් හට එබඳු ක්‍රියාකාරකම් පිළිබඳ දැනුමක් නොතිබිණි. නියාමනය, අධීක්ෂණය, නිරීක්ෂණය ආදී අදාල නොවන උත්තර සමහර අයදුම්කරුවන් ලියා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

# <u>B කොටස</u>

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත වූ අතර විගණන වාර්තාව හා විගණන මතය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂාකිරීම සඳහා යොමු වී තිබුණි. අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට මධ්‍යස්ථ මට්ටමකින් උත්තර සපයා තිබුණේය. **(a) සහ (b) කොටස්** සඳහා අයදුම්කරුවන් ලියා තිබූ උත්තර සතුටු දායක මට්ටමක විය. කෙසේ වෙතත් **(b) කොටස** සඳහා වන විගණන මතය සකස් කිරීමෙහි ලා සලකාබැලෙන කරුණු සමහර අයදුම්කරුවන් විසින් පැහැදිලි ලෙස සම්බන්ධකර නොතිබුණු අතර සම්පූර්ණ උත්තරයක් ලෙස සලකා බැලිය නොහැකි අසම්පූර්ණ වචන සඳහන් කර තිබුණි. උදාහරණ වශයෙන් ''කළමණාකරණය විසින් පිළියෙල කරන ලද ගිණුම්කරන ඇස්තමේන්තු සාධාරණ වේද?" වෙනුවට ''ගිණුම්කරන ඇස්තමේන්තු" යන පදය පමණක් සඳහන් කර තිබීම. ''තෝරාගෙන යොදවා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය වාර්තාකරණ රාමුව හා සංගත වේද" වෙනුවට අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ ''ගිණුම්කරණ ප්‍රතිපත්ති" පමණක් වීම ආදියයි.

සමහර අයදුම්කරුවන්ට විගණන මතය පිළිබඳ නියම දැනුමක් නැති බව පෙනේ. එම නිසා ප්‍රශ්නයේ **(a) කොටස** වෙනුවෙන් විකරණය කළ මත වර්ග සඳහන් නොකර සමහරු විකරණය කළ මතය හා විකරණය නොකළ මතය යනුවෙන් විගණන මත වර්ග දෙක සඳහන් කර තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

තක්සේරු කාර්යභාරයන් පිළිගැනීමේදී මූලික ආචාරධර්ම මූලධර්ම සහ ආරක්ෂක ක්‍රමවලට අනුකූල වීම කෙරෙහි එල්ලවන තර්ජන පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලදී. මෙම ප්‍රශ්නය න්‍යායාත්මක දැනුම මත පදනම් වූවකි.

ආරක්ෂක ක්‍රම පිළිබඳව පරීක්ෂාකර තිබූ **(a) කොටසට** අයදුම්කරුවන් උත්තර සපයා සතුටුදායක ලකුණු ලබාගෙන තිබුණේය. එහෙත් **(b) කොටස** සඳහා සමහර අයදුම්කරුවන් හොඳින් උත්තර ලියා තිබුණේ නැත. මූලික මූලධර්මයන්ට අනුකූල වීම කෙරෙහි එලඹෙන තර්ජන අයදුම්කරුවන් බොහොමයක් හඳුනාගෙන තිබුණු නමුත් ඔවුන්ට ම තර්ජන පැහැදිලි ලෙස විස්තර කිරීමට නොහැකි වී ඇත. එනිසා සමහර අයදුම්කරුවන් තර්ජන සඳහා වැරදි පැහැදිලි කිරීම් දක්වා තිබුණේය. උදා:- සේවාදායක සමග දීර්ඝ ආශ්‍රය නිසා ස්වයං ඇල්ම ජනිත වීම ආදිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 07

විගණන කාර්යභාරය සඳහා සැලසුම්කරණය පිළිබඳ ලියවිල්ල සහ විගණන ලිඛිතකරණය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. සැලසුම්කරණය පිළිබඳ ලියවිල්ලේ ඇතුලත් කළ යුතු කරුණු **(A) කොටසින්** පරීක්ෂාකර ඇති අතර **B (a) කොටසින්** ස්ථාවර විගණන ලිපිගොනුවෙහි ඇතුලත් කරනු ලැබිය හැකි තොරතුරු වර්ග පරීක්ෂා කිරීම සිදුකර තිබේ.

අයදුම්කරුවන් බොහොමයක් සම්පූර්ණ ප්‍රශ්නයටම උත්තර සපයා ඇත. බොහොමයකට සැලසුම්කරණය පිළිබඳ ලියවිල්ල යනු කුමක් දැයි නියම දැනීමක් නොතිබූ බව පෙන්වූ අතර එහි ප්‍රයෝජන ගැන සහ එහි ඇතුලත් තොරතුරු ගැනද වැටහීමක් ඇතැයි නොදැනුණි.

වැඩ පත්‍රිකා සහ ස්ථාවර විගණන ලිපිගොනුව ආදිය ආශ්‍රිත ප්‍රායෝගික අත්දැකීම් නොමැතිකමින් ප්‍රශ්නයේ **B (b) කොටසට** අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි උත්තර ලිවීමට අසමත් විය. ඔවුන්ගෙන් සමහරක් ස්ථාවර විගණන ලිපිගොනුවේ ඇතුලත් ලෙස වැරදි තොරතුරු සඳහන් කර තිබුණේය. උදා:- ඉකුත් වර්ෂයේ විගණනයේදී ලබාගත් විගණන සාක්ෂි විගණන ක්‍රියා පටිපාටි සහ ක්‍රමවේද පසුගිය වසරේ විගණන වාර්තා ආදිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## <u>C - කොටස</u>

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය. **(A) කොටස (a), (b), (c) හා (d)** යන **උපකොටස්** 4 කින් යුක්ත වූ අතර **(B) කොටස (a), (b)** හා **(c) උපකොටස්** තුනකින් යුක්ත විය. දී තිබූ කරුණු අධ්‍යයනය මත පදනම්ව අභ්‍යන්තර පාලනයක් පාලන පරිසරය සහ තොරතුරු තාක්ෂණය පාලනයන්ට අදාල සංකල්ප තේරුම් ගැනීමට අයදුම්කරුවන්ගේ හැකියාව සමස්ථයක් වශයෙන් ප්‍රශ්නයෙන් පරීක්ෂා කිරීමට ලක් කර ඇත.

**<u>(A) කොටස</u>**

**(a) කොටස** වැටුප් ගෙවීම් ක්‍රමයේ අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනා ගැනීම කෙරෙහි කේන්ද්‍රගතව තිබිණි. **(b) කොටසින්** එකී දුර්වලතා පිටු දැකීම පිණිස කරනු ලබන නිර්දේශ පිළිබඳව විමසන ලදී. **(c) කොටසින්** සඵලදායී වැටුප් ගෙවීමේ ක්‍රියාවලියක අරමුණු විමසා ඇත. බොහොමයක් අයදුම්කරුවන් එකී කොටස් තුනටම සාර්ථක ලෙස උත්තර ලියා සම්පූර්ණ ලකුණු උපයා ගෙන තිබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් සියළු දෙනාම වාගේ තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලනයන් සහ යෙදවුම් පාලනයන් පිළිබඳ දැනුම පරීක්ෂාකර **(c) කොටසට** උත්තර සපයා තිබුණේ නැත.

තොරතුරු තාක්ෂණ පාලනයන් පිළිබඳ දැනුමක් අයදුම්කරුවන් සතුව නොතිබූ බව පෙනෙන්ට තිබුණි. මෙම කොටසට උත්තර සැපයූ සමහර අයදුම්කරුවන්ට සාමාන්‍ය පාලනයන් හා යෙදවුම් පාලනයන් පටලවාගෙන වෙන් කොට හඳුනා ගත නොහැකිව තිබූ වන පෙනුණි. සමහර අයදුම්කරුවන් සාමාන්‍ය පාලනයන්ට පමණක් උදාහරණ දක්වා තිබුණේය. උදාඃ-මුරපද පාලනයන්, උපස්ථ කිරීම, දොරගුළු ලෑම, ෆයර්වෝල් බාධක ආදිය. බොහෝමයකට යෙදවුම් පාලනයන් පිළිබඳ පැහැදිලි වැටහීමක් තිබී නැත.

**<u>(B) කොටස</u>**

අභ්‍යන්තර පාලන පද්ධතියේ අරමුණු පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුවත් භාවය **(a) කොටසින්** පරීක්ෂාකර තිබේ. පාලන ක්‍රියාවලීන් පිළිබඳ දැනුම කෙරෙහි **(b) කොටස** කේන්ද්‍ර ගත වී ඇත. **(c) කොටස** මඟින් පරීක්ෂාකර ඇත්තේ අභ්‍යන්තර පාලනයන්හි ආවේණික සීමාකරන පිළිබඳ සංකල්පයයි. සංවිධානයක මෙහෙයුම් කෙරෙහි අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රයෝජනවත් භාවය තේරුම් ගැනීමට බොහෝ අයදුම්කරුවන් අසමත්වී ඇත. අභ්‍යන්තර පාලන පද්ධතියේ අරමුණු සඳහා බොහෝ අයදුම්කරුවන් සාමාන්‍ය උත්තර සපයා තිබුණි. උදාඃ- ඵලදායී සහ කාර්යක්ෂම ලෙස සංවිධානමය අරමුණු මුදුන්පත් කරගැනීම, කාර්යමණ්ඩලය අතර රාජකාරී කටයුතු බෙදා වෙන්කර දීම ආදිය.

අයදුම්කරුවන් බොහෝ දෙනෙකු පාලන ක්‍රියාවලීන් පැහැදිලි ලෙස දැන සිටි බවක් නොපෙනේ. ඔවුන් අතුරෙන් සමහරෙකු අධීක්ෂණය, සංවිධානය ආදි සාමාන්‍ය උත්තර සපයා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය. **(A) කොටසේ (a), (b), (c), (d)** හා **(e)** යනුවෙන් අනුකොටස් 5 ක් ද **(B) කොටසේ (a)** හා **(b)** යනුවෙන් අනුකොටස් දෙකක්ද තිබුණි. මෙම ප්‍රශ්ණය කරුණු අධ්‍යයනයක් මත පදනම් වී තිබූ අතර සමාගමක විගණනයක් සිදුකිරීමේදී තිබිය යුතු ප්‍රායෝගික දැනුම පිළිබඳව පරීක්ෂාකිරීම කෙරෙහි යොමුවී තිබුණි.

**(A) කොටස**

විගණන ක්‍රියාවලිය ඉටුකිරීම සඳහා අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීම, පාලන පරීක්ෂාවන් හා තහවුරු කිරීමේ පටිපාටි හඳුනා ගැනීම, සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු හඳුනාගැනීම සහ අනාවරණය කර ගැනීම ආදිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලදී.

**(a)** විගණන පටිපාටි ඉටු කිරීමේදී විශේෂ අවදානය යොමුකළ යුතු අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම කෙරෙහි කේන්ද්‍රගත වූවකි. අයදුම්කරුවන් බොහොමයක් අවදානම් ක්ෂත්‍ර හඳුනාගැනීමට අපොහොසත් වූහ. විගණනයෙහි ප්‍රායෝගික පුහුණුවක් නොතිබීම මෙයට හේතු විය.

**(b)** විගණන පටිපාටියක් ලෙස තහවුරු කිරීම යොදාගත හැකි අවස්ථාවන් කෙරෙහි කේන්ද්‍රගත විය. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා සතුටුදායක ලෙස ලකුණු ලබා තිබුණේය.

**(c)** පාලන පරීක්ෂණ සහ තහවුරු කිරීමේ පටිපාටි අතර වෙනස පිළිබඳ දැනුම මෙහිදී පරීක්ෂාකර ඇත. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට අදාල නොවන උත්තර සපයා තිබුණේය. මෙම විගණන සංකල්ප දෙක අතර වෙනස පිළිබඳ පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන්ට තිබූ බවක් පෙනුනේ නැත.

**(d)** සහ **(e)**

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කෙරෙහි කේන්ද්‍රගත වී ඇත. සම්බන්ධිත පාර්ශව හඳුනාගැනීම සඳහා වගකිව යුතු පාර්ශවය බොහොමයක් අයදුම්කරුවන් විසින් පැහැදිලිව හඳුනාගෙන තිබුණේය. එහෙත් **(d) කොටස** සඳහා විගණන ආයතනය, පරිචයේ යෙදෙන්නන්, කළමනාකාර අධ්‍යක්ෂකගේ බිරිඳ ආදී අදාල නොවන උත්තර ද සමහර අයදුම්කරුවන් සඳහන් කර තිබුණි. **(e) කොටස** සඳහා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනා ගැනීමේදී දෙන ලද සමාගමේ අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීමට සමහර අයදුම්කරුවන් අසමත් විය.

**(B) කොටස**

විගණනයක ප්‍රමාණාත්මකභාවය පිළිබඳ තක්සේරුව පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පිළිබඳව මෙම කොටසින් පරීක්ෂාකර ඇත.

**(a)** විගණකගේ ප්‍රමාණාත්මකභාවය තක්සේරුකිරීමේ වැදගත්කම මෙම කොටසින් පරීක්ෂාකර ඇත. බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා නිවැරදිව උත්තර ලියා සම්පූර්ණ ලකුණු උපයාගෙන ඇත.

**(b)** බොහොමයක් අයදුම්කරුවන්ට ප්‍රමාණාත්මභාවයේ මට්ටම ගණනය කරන්නේ කෙසේද, ප්‍රමාණවත්භාවයේ මට්ටමේ ප්‍රයෝජන මොනවාද, විගණකයෙකු විගණනයේදී ප්‍රමාණාත්මභාවය යොදාගන්නේ කෙසේද යන කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබී නැත. ප්‍රමාණවත් භාවයේ මට්ටම යෙදවීම පිළිබඳව ප්‍රායෝගික දැනුමක් නොමැති කම නිසා අයදුම්කරුවන් මෙම කොටසට උත්තර ලිවීමේ අසමත් වූ අතර සතුටුදායක ලකුණු ලබා ගැනීමටද නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

\- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:</u>**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඨමාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඨමාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඨමාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -